# චීන භාෂාව, වාග්විද්‍යාව සහ පර්යේෂණ ප්‍රවේශ

## Chinese Language, Linguistics and Research Approaches

තෙරිපැහැ උපනන්ද හිමි

**Abstract**

Researches what is relevant to that field are most significant for efficiency to any field all over the world. In addition, Researches what is relevant to languages and various kind of subjects are going up to advantage of that's fields. Then, Linguistics' researches are made a support to resolve problems what is related to the field of Linguistics. Linguistics is grown up by its every successful research. It is concerned for what is related to linguistics researches of Chinese Language. Researches are mainly classified as Qualitative and Quantitative. The Specific features of Qualitative and Quantitative researches can be identified separately. The similarity and dissimilarity of Qualitative and Quantitative researches can be analyzed separately. In this research, it is investigated how Research Approaches what are Qualitative and Quantitative can be used for researches related Linguistics of Chinese. It is discussed what is the way of Research Approaches what are Qualitative and Quantitative can be used doing researches related to Chinese Language and Linguistics.

**Key Words:-** Chinese Language, Linguistics, Numerical data, Qualitative, Quantitative, Research Approaches

**සාරසංක්ෂේපය**

ලෝකයේ ඕනෑම ක්ෂේත්‍රයක කාර්යක්ෂමතාව සඳහා ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදාළ පර්යේෂණ ඉතා වැදගත් වේ. මීට අමතරව

භාෂා හා විවිධ විෂයයන් සම්බන්ධ පර්යේෂණ එම විෂයයන්හි දියුණුවට හේතු වේ. ඒ අනුව වාග්විද්‍යා විෂය ක්ෂේත්‍රයට අදාළව පැන නගින ගැටලු නිරාකරණය සඳහා පර්යේෂණ කාර්යයෙන් මනා පිටුබලයක් සැලසේ. වාග්විද්‍යා විෂය ක්ෂේත්‍රයෙහි සිදුවන සෑම සාර්ථක පර්යේෂණයක් මගින්ම එම විෂය දියුණුවට පත් වේ. චීන භාෂාව සම්බන්ධ වාග්විද්‍යානුකූල පර්යේෂණ සඳහා ද මෙම කරුණ අදාළ වේ. පර්යේෂණ ප්‍රධාන වශයෙන් ප්‍රමාණාත්මක හා ගුණාත්මක වශයෙන් වර්ග කර ඇති අතර ගුණාත්මක හා ප්‍රමාණාත්මක පර්යේෂණවල, විශේෂ ලක්ෂණ වෙන වෙනම හඳුනාගත හැකිය. සමානතා සහ අසමානතා වෙන වෙනම වර්ගීකරණයට ලක් කළ හැකිය. මේ අධ්‍යයනයෙහිදී, චීන භාෂාව සම්බන්ධ වාග්විද්‍යානුකූල පර්යේෂණ සඳහා ගුණාත්මක හා ප්‍රමාණාත්මක පර්යේෂණ ප්‍රවේශ යොදා ගත හැකිද යන්න විමර්ශනය කෙරෙයි. චීන භාෂාව සම්බන්ධ වාග්විද්‍යාත්මක පර්යේෂණ සිදු කිරීමේදී ගුණාත්මක සහ ප්‍රමාණාත්මක පර්යේෂණ ප්‍රවේශ යොදා ගත හැකි ආකාරය සාකච්ඡා කෙරෙයි.

**යතුරු පදඃ-** ගුණාත්මක දත්ත, චීන භාෂාව, පර්යේෂණ ප්‍රවේශ, ප්‍රමාණාත්මක දත්ත, වාග්විද්‍යාව, සංඛ්‍යාත්මක දත්ත

**හැඳින්වීම**

ඕනෑම ක්ෂේත්‍රයක දියුණුවට හෝ පිරිහීමට හේතු වන්නේ එම ක්ෂේත්‍රවල කාර්යක්ෂමතාව හෝ අකාර්යක්ෂමතාවයි. එම ක්ෂේත්‍ර පිරිහීමට පත් සෑම විටම හේතු කරුණු සොයා බලා, උචිත පර්යේෂණ ක්‍රමශිල්ප අවස්ථානුකූලව යොදා ගනිමින්, ශාස්ත්‍රීය පර්යේෂණ මගින් මතුවන විසඳුම් ක්‍රියාත්මක කිරීම වැදගත් වේ. වර්තමානයේ ආර්ථික, දේශපාලන, සාමාජික යනාදි වශයෙන් ඇති ගැටලු නිරාකරණයේදී සියලු පාර්ශ්වයන්ගේ සහයෝගයෙන් සහ උචිත පර්යේෂණ ක්‍රමවේද ආශ්‍රයෙන් ශාස්ත්‍රීය පර්යේෂණයන්ගෙන් වඩා ඵලදායී විසඳුම් සහ ප්‍රතිකර්ම සොයා ගත හැකිය. එතුළින් එකී සෑම ක්ෂේත්‍රයකම සංවර්ධනයට හා දියුණුවට පර්යේෂණ කාර්යයෙන් ලැබෙන පිටුබලය අතිමහත් වේ.

භාෂාවන් පිළිබඳ විද්‍යාත්මකව අධ්‍යයනය කෙරෙන වාග්විද්‍යා විෂය ක්ෂේත්‍රයට අදාළව පැන නගින ගැටලු රාශියක් තිබේ. වචන,

පාද, වාක්‍ය, අර්ථ, ප්‍රකරණ වැනි භාෂා අභ්‍යන්තරික ඒකකවල පැන නැගෙන ගැටලු මෙන්ම භාෂා සම්මතකරණය, වාක්කෝෂකරණය, විෂය මාලා සංවර්ධනය, ශ්‍රවණාබාධ සහිත දරුවන් හඳුනා ගැනීම, සාම්ප්‍රදායිකව භාෂණය පහත් දෙයක් සේ සැලකීම මඟින් වියැකී යන භාෂා ප්‍රවර්ග ආරක්ෂා කර ගැනීම, සුළු ජාතීන්ගේ ද, මහ ජාතීන්ගේ ද භාෂාවන් සුරක්ෂිත කිරීම, භාෂාවේ නව ප්‍රවණතා හඳුනා ගැනීම වැනි භාෂා ව්‍යවහාරික ගැටලු නිරාකරණය සඳහා පර්යේෂණ කාර්යයෙන් මනා පිටුබලයක් සැලසේ. මීට අමතරව භාෂා හා විවිධ විෂයයන් සම්බන්ධ පර්යේෂණ එම විෂයන්හි දියුණුවට හේතු වේ. වාග්විද්‍යා විෂය ක්ෂේත්‍රයෙහි සිදුවන සෑම සාර්ථක පර්යේෂණයක් මගින්ම එම විෂය දියුණුවට පත් වේ. දෙවන භාෂාවක් ලෙස චීන භාෂාව හදාරණ විද්‍යාර්ථීහු ශ්‍රී ලංකාව තුළත් ඉන් පිටතත් පර්යේෂණ කාර්යයෙහි නිරත වෙති. එතුළින් චීන භාෂාව දියුණුවට පත් වේ. භාෂාන්තර අධ්‍යයන දියුණුවට පත් වේ. සාම්ප්‍රදායික, වාග්විද්‍යාත්මක ක්‍රමවේද අනුගමනය කෙරෙයි. ප්‍රමාණාත්මක සහ ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශ අනුගමනය කෙරෙයි. ව්‍යාපාරික, අධ්‍යාපනික වැනි විවිධ ක්ෂේත්‍රවල පර්යේෂණ මේ යටතේ වර්ග කළ හැකිය. මෙම අධ්‍යයනය තුළ වාග්විද්‍යාත්මක ප්‍රවේශයකින් චීන භාෂාව පර්යේෂණයට ලක් කිරීම බොහෝ චීන භාෂාව සම්බන්ධ ගැටලු නිරාකරණයට රුකුලක් වේය යන්න අවධාරණය කෙරෙයි.

**පර්යේෂණ අරමුණ**

චීන භාෂාව සම්බන්ධ වාග්විද්‍යාත්මක පර්යේෂණ සිදු කිරීමේදී ගුණාත්මක සහ ප්‍රමාණාත්මක පර්යේෂණ ප්‍රවේශ සාර්ථකව යොදා ගත හැකි ආකාරය සොයා බැලීම මෙම පර්යේෂණයෙහි අරමුණයි.

**පර්යේෂණ ක්‍රමවේදය**

ගුණාත්මක පර්යේෂණයක් ලෙස සිදු කරන ලද මෙම පර්යේෂණයේදී චීන භාෂාව, වාග්විද්‍යාව සහ පර්යේෂණ ක්‍රමවේදය යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළ ද්විතීයික මූලාශ්‍ර ඇසුරින් දත්ත රැස්කරන ලදි. මීට අමතරව පර්යේෂකයින් සමඟ කරන ලද සාකච්ඡා ඇසුරින් දත්ත රැස්කරන ලදි.

**පර්යේෂණ ගැටලුව**

චීන භාෂාව සම්බන්ධ වාග්විද්‍යාත්මක පර්යේෂණ සිදු කිරීමේදී ගුණාත්මක සහ ප්‍රමාණාත්මක පර්යේෂණ ප්‍රවේශ යොදා ගත හැකි වන්නේ කෙසේද, යන්න පර්යේෂණ ගැටලුවයි.

**විග්‍රහය**

පර්යේෂණයේදී අධ්‍යයනය කරන පර්යේෂණයෙහි ස්වභාවය හා අනුගමනය කරන ක්‍රම ශිල්ප අනුව පර්යේෂණ ස්වරූපය වෙනස් වේ. සමාජ විද්‍යා ක්ෂේත්‍රයෙහි සිදු කරන පර්යේෂණ සමාජ විද්‍යා පර්යේෂණ ලෙසත්, අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිදු කරන පර්යේෂණ අධ්‍යාපන පර්යේෂණ ලෙසත් හැඳින් වේ. මෙහිදී පළමුව පර්යේෂණ ක්‍රම පිළිබඳ හඳුනා ගැනීම වැදගත් වේ.

"පර්යේෂණ ක්‍රියාවලියේදී තොරතුරු විස්තර කිරීමට හා අනාවැකි ඉදිරිපත් කිරීමට භාවිත කරන දත්ත ලබා ගන්නා ක්‍රමයන්හි සීමාවන් පර්යේෂණ ක්‍රම වේ." (Cohen and Manion, 1992) (සිල්වා සහ වනසිංහ, 2004: 20)

දත්ත ලබා ගන්නා ක්‍රමයන්හි සීමාවන් අනුව පර්යේෂණ ක්‍රම වර්ග කළ හැකි බව කොහෙන් හා මැනියන් අදහස් කරයි. ඒ අනුව දත්ත ලබා ගැනීමට අනුගමනය කරන ප්‍රශ්නාවලි, ප්‍රශ්නාවලි නිරීක්ෂණ, සහභාගිත්ව නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා, ප්‍රක්ෂේපණ ක්‍රම ශිල්ප, ලේඛන විශ්ලේෂණය ආදි ක්‍රම අනුව පර්යේෂණ වර්ග කළ හැකිය.

"තොරතුරු ලබා ගැනීමට අනුගමනය කරන ක්‍රමය ලබාගන්නා තොරතුරුවල ස්වභාවය, දත්ත විශ්ලේෂණය කරන ආකාරය, නියදිකරණය ආදි ලක්ෂණ අනුව පර්යේෂණ ක්‍රම වර්ග කළ හැකිය." (Borg etal, 1993) (සිල්වා සහ වනසිංහ, 2004: 20)

බෝර්ග් පවසන පරිදි පර්යේෂණයක් කුමන වර්ගයකට අයත්දැයි තීරණය කිරීමට සාධක රැසක් සලකා බැලිය යුතුය.

"පර්යේෂණ පුළුල් වශයෙන් ගත් කල ප්‍රමාණාත්මක හා

ගුණාත්මක යනුවෙන් කොටස් දෙකකට බෙදිය හැකිය. හඳුනා ගැනීමේ පහසුව සඳහා මෙසේ කොටස්වලට වෙන් කළ ද පර්යේෂණ සඳහා ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක යන ක්‍රම දෙකම යොදා ගැනීම යෝග්‍ය බව රිචඩ් හා කුක් (Reichardt and Cook, 1979) ප්‍රකාශ කරයි." (සිල්වා සහ වනසිංහ, 2004: 21)

මෙහි 'පර්යේෂණ පුළුල් වශයෙන් ගත් කල', සහ 'හඳුනා ගැනීමේ පහසුව සඳහා' යන ප්‍රකාශ මගින් මෙම ද්වෛධීකරණයෙහි අරමුණ හා ස්වභාවය ඉදිරිපත් කෙරෙයි. පර්යේෂණය නම් පුළුල් විෂය ක්ෂේත්‍රය හඳුනා ගැනීමේ පහසුව සඳහා කොටස් දෙකකට වෙන් කර ඇත.

a. ගුණාත්මක පර්යේෂණ

b. ප්‍රමාණාත්මක පර්යේෂණ

ගුණාත්මක හා ප්‍රමාණාත්මක පර්යේෂණ යොදා ගත හැකි ආකාරය

**ගුණාත්මක පර්යේෂණ**

ගුණාත්මක පර්යේෂණ සමාජීය හා චර්යා විද්‍යාත්මක පර්යේෂණ සඳහා යොදා ගනියි. ගුණාත්මක පර්යේෂණ විශේෂයෙන් මානව විද්‍යාව, සමාජ විද්‍යාව, මනෝ විද්‍යාව, ඉතිහාසය, භාෂාත්මක ක්ෂේත්‍ර සඳහා යොදා ගත හැකිය. මෙම සමාජීය විද්‍යා විෂය ක්ෂේත්‍ර ඔස්සේ සංවර්ධනය වන වාග්විද්‍යා විෂය ක්ෂේත්‍රය සඳහා ද ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශය වැඩි වශයෙන් යොදා ගත හැකිය. වාග්විද්‍යා විෂය ඉතා පුළුල් විෂය ක්ෂේත්‍රයක් වන බැවින්, එහි සමාජ වාග්විද්‍යාව, ඓතිහාසික වාග්විද්‍යාව, මනෝවාග්විද්‍යාව, ශෛලිවිෂයක වාග්විද්‍යාව යන විෂයයන්ට අදාළව මෑත කාලීනව වැඩි වශයෙන් සාකච්ඡාවට බඳුන් වන, හඳුනා ගත් මාතෘකා කිහිපයක් පමණක් පහතින් සඳහන් කරනු ලැබේ.

### I. සමාජ වාග්විද්‍යාව

උපභාෂා විමර්ශනය (Dialectology), ප්‍රකරණ භාෂා විමර්ශනය, ප්‍රාස්තාවික භාෂා විමර්ශනය, ද්විභාෂිකත්වය, බහුභාෂක සමාජ, මිනිසුන්ගේ චර්යාවන්, සතුන්ගේ චර්යාවන් යනාදිය.

### II. ඓතිහාසික වාග්විද්‍යාව

ශබ්ද පරිණාමය, ශබ්දිම පරිණාමය, පරිණාම සාධක, පරිණාම සිද්ධි, ව්‍යවහාරික වාග්විද්‍යාවෙහි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද, අන්තර් භාෂාමය භාෂා දෝෂ, භාෂාන්තර භාෂා දෝෂ, විවිධ භාෂා ආබාධ නිසා ඇති වන ගැටලු, සිව්භාෂා කුසලතාව, සංස්කෘතික කුසලතාව යනාදිය.

### III. මනෝවාග්විද්‍යාව

භාෂා උපාර්ජනය, මානව සන්නිවේදනය සෙසු සන්නිවේදන ක්‍රමවලින් වෙනස් වන ආකාරය, භාෂණ ක්‍රියාවලිය, භාෂාවත් මොළයත් අතර සම්බන්ධතාව, මන්ද මානසික තත්ත්වය හා ඔවුන්ගේ සන්නිවේදන ගැටලු යනාදිය.

### IV. ශෛලිවිෂයක වාග්විද්‍යාව

සාහිත්‍යකරුවන්, නවකතාකරුවන්, ලේඛකයින්, සිනමාකරුවන් ආදීන් භාවිත කරන විවිධ ශෛලීන් මෙ යටතේ අධ්‍යයනය කෙරෙයි.

වාග්විද්‍යා විෂය ක්ෂේත්‍රයෙහි වර්තමානය වන විට වඩාත් අවධානයට ලක් වුණු මාතෘකා ලෙස මේවා හැඳින්විය හැකිය. එම කාරණා ඇසුරින් කෙරෙන පර්යේෂණවලදී වැඩි වශයෙන් ගුණාත්මක පර්යේෂණ ක්‍රමය යොදා ගත හැකිය. ඓතිහාසික වාග්විද්‍යාවෙහි පර්යේෂණ සිදු කිරීමේදී ගුණාත්මක පර්යේෂණ ක්‍රමය අනිවාර්ය සාධකයක් වේ. ඒ අනුව චීන භාෂාව සම්බන්ධ වාග්විද්‍යාත්මක සමාජීය හා චර්යා විද්‍යාත්මක පර්යේෂණ සඳහා ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශය යොදා ගත හැකිය.

**ප්‍රමාණාත්මක පර්යේෂණ**

ප්‍රමාණාත්මක පර්යේෂණ භෞතික විද්‍යා ක්ෂේත්‍රයේ පර්යේෂණ සඳහා යොදා ගනී. ප්‍රමාණාත්මක පර්යේෂණ මගින් සංඛ්‍යා විද්‍යාත්මකව දත්ත විශ්ලේෂණය කරනු ලැබේ. එමෙන්ම, ශාස්ත්‍රීය පර්යේෂණ සඳහා යොදා ගත හැකිය. භෞතික විද්‍යා විෂය ක්ෂේත්‍ර ඔස්සේ සංවර්ධනය වන වාග්විද්‍යා විෂය ක්ෂේත්‍රය සඳහා ද මෙම ප්‍රමාණාත්මක පර්යේෂණ යොදා ගත හැකිය. වාග්විද්‍යා විෂය ඉතා පුළුල් විෂය ක්ෂේත්‍රයක් වන බැවින්, එහි ව්‍යවහාරික වාග්විද්‍යාව, මනෝ වාග්විද්‍යාව, ආකෘතිවිෂයක වාග්විද්‍යාව යන විෂයයන්ට අදාළව මෑත කාලීනව වැඩි වශයෙන් සාකච්ඡාවට බඳුන් වන, හඳුනා ගත් මාතෘකා කිහිපයක් පමණක් පහතින් සඳහන් කරනු ලැබේ.

I. ව්‍යවහාරික වාග්විද්‍යාව

දෙවන හෝ විදේශ භාෂා ඉගැන්වීම, Grammar Translation Method, Direct Method, Audio-visual Method, Community Language Teaching, Silent Method, Natural Method, Communicative Language Teaching, Blend of Previous method, Total Physical Response, Community Language Learning, Task-based Language Learning, Eclectic Approach, Learning Strategy Training Cooperative Learning and Multiple Intelligences, Structural Approach, Old Approach and Situational Language Teaching වැනි නව සහ පැරණි ඉගැන්වීම් ක්‍රම පිළිබඳ අධ්‍යයන සඳහා යොදා ගත හැකිය.

භාෂා පරිවර්තන ක්‍රම, වාග්කෝෂකරණය, භාෂා සැලසුම්කරණය, සායනික වාග්විද්‍යාව, පරිගණක වාග්විද්‍යාව, ද්විභාෂිකත්වය, බහුභාෂිකත්වය, පරිගණක සන්නිවේදනය, සංවාද විශ්ලේෂණය, භාෂා තක්සේරුව, සාක්ෂරතාවය, දේශන විශ්ලේෂණය, දෙවන භාෂා උපාර්ජනය, ශබ්ද කෝෂ විද්‍යාව, ප්‍රතිපත්ති සම්පාදනය, ශෛලීය විද්‍යාව, ප්‍රායෝගික විද්‍යාව, පරිවර්තනය වැනි ව්‍යවහාරික වාග්විද්‍යාවෙහි නව ප්‍රවණතා පිළිබඳ පර්යේෂණවලදී සංඛ්‍යා විද්‍යාත්මකව දත්ත විශ්ලේෂණය සඳහා ප්‍රමාණාත්මක පර්යේෂණ ප්‍රවේශය යොදා ගත හැකිය.

## II. මනෝ වාග්විද්‍යාව

න්‍යුරෝන වාග්විද්‍යාව (Neurolinguistics), මොළයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධ විද්‍යාව (භෞතික), සන්නිවේදන දුබලතා පිළිබඳ අධ්‍යයනය කරන සායනික විද්‍යාව (Clinical Linguistið ) වැනි ක්ෂේත්‍රවල පර්යේෂණවලදී සංඛ්‍යා විද්‍යාත්මකව දත්ත විශ්ලේෂණය සඳහා ප්‍රමාණාත්මක පර්යේෂණ ප්‍රවේශය යොදා ගත හැකිය.

## III. ආකෘතිවිෂයක වාග්විද්‍යාව

භාෂාවල පොදු ලක්ෂණ සහ ආවේණික ලක්ෂණ අනුව භාෂා වර්ගකිරීමේදී ප්‍රමාණාත්මක පර්යේෂණ ප්‍රවේශය යොදා ගත හැකිය.

වාග්විද්‍යා විෂය ක්ෂේත්‍රයෙහි වර්තමානය වන විට වඩාත් අවධානයට ලක් වුණු මාතෘකා සහ පැරණි මාතෘකා ඉහතින් සඳහන් කෙරිණි. එම කාරණා ඇසුරින් කෙරෙන පර්යේෂණවලදී ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමය වැඩි වශයෙන් යොදා ගත හැකිය. ඒ අනුව චීන භාෂාව හා වාග්විද්‍යාව සම්බන්ධ භෞතික විද්‍යා පර්යේෂණ සඳහා ප්‍රමාණාත්මක පර්යේෂණ ප්‍රවේශය යොදා ගත හැකිය. සමහර පර්යේෂණ සඳහා පර්යේෂණ ප්‍රවේශ දෙකම එකවර භාවිත කළ හැකිය. නිදසුන් ලෙස භාෂාවල පොදු ලක්ෂණ සහ ආවේණික ලක්ෂණ විමසීමේදී ගුණාත්මක පර්යේෂණයක් ලෙසත්, ප්‍රමාණාත්මක පර්යේෂණයක් ලෙසත් පර්යේෂණය සිදු කළ හැකිය. ප්‍රවේශ දෙකම එකවර භාවිතා කිරීම ද කළ හැකිය. වඩා ප්‍රයෝජනවත් ක්‍රමය තෝරා ගත යුතුය. පැරණි භාෂාවල නම් ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශය ද, ව්‍යවහාරික භාෂා නම් ප්‍රමාණාත්මක ප්‍රවේශය ද වඩා යෝග්‍ය වේ. ශිෂ්‍ය සාධනය පරීක්ෂා කිරීම සඳහා වඩාත් යෝග්‍ය වනුයේ ප්‍රමාණාත්මක පර්යේෂණ ප්‍රවේශයයි.

ප්‍රමාණාත්මක හා ගුණාත්මක පර්යේෂණ වෙනස හඳුනා ගැනීමට ඒවායේ විශේෂ ලක්ෂණ අවබෝධ කර ගත යුතුය. එවැනි විශේෂ ලක්ෂණ බෝග් ඇතුළු පිරිස දක්වා තිබේ.

ප්‍රමාණාත්මක, ගුණාත්මක පර්යේෂණවල විශේෂ ලක්ෂණ

a. සාමාන්‍යකරණය කිරීමේ හැකියාව හා නියදියක් තෝරා ගැනීමේ ප්‍රයෝජන

**ගුණාත්මක පර්යේෂණ ලක්ෂණ:**

තෝරාගත් පුද්ගලයන්, සංස්කෘතීන්ට අනුව උපකල්පන සීමා වේ.

සාමාන්‍යකරණයෙන් තොරව කටයුතු කරයි.

**ප්‍රමාණාත්මක පර්යේෂණ ලක්ෂණ:**

විවිධ උපකල්පන මත රඳා පවතී.

නියදි ආශ්‍රයෙන් සාමාන්‍යකරණය කළ හැක.

**b.** පර්යේෂකයා හා පර්යේෂණයට භාජනය වන පුද්ගලයා අතර සබඳතා

**ගුණාත්මක පර්යේෂණ ලක්ෂණ:**

අධ්‍යයනයට සම්බන්ධ පුද්ගලයන්ගේ රුචිකත්වයට අනුව කටයුතු කරයි.

ස්වාධීන අදහස්වලට ඉඩ දේ. විවෘත ක්‍රම තුළින් දත්ත ලබා ගනී.

**ප්‍රමාණාත්මක පර්යේෂණ ලක්ෂණ:**

පර්යේෂකයාගේ අරමුණු මත පර්යේෂණ ක්‍රියාවලිය රඳා පවතියි. පර්යේෂකයා ඉදිරිපත් කරන ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා තුළින් අරමුණට අදාළව තොරතුරු ලබා ගනියි.

c. වටිනාකම් අවධාරණය කිරීම

**ගුණාත්මක පර්යේෂණ ලක්ෂණ:**

සියලු පර්යේෂණ අගයයන් මත පවතින බව විශ්වාස කරයි.

පුද්ගල අගයයන් සඳහා ප්‍රමුඛත්වයක් ලබා දේ.

**ප්‍රමාණාත්මක පර්යේෂණ ලක්ෂණ:**

පුද්ගල අගයයන් නිශ්චිතව විග්‍රහ නොකරයි.

ඒවා පිළිබඳ ප්‍රශ්න කිරීම් සිදු කරයි.

d. සංදර්භය සම්බන්ධ අධ්‍යයනය

**ගුණාත්මක පර්යේෂණ ලක්ෂණ:**

සංකීර්ණ සංකල්ප අවබෝධ කර ගැනීමට උත්සාහ කරයි.

**ප්‍රමාණාත්මක පර්යේෂණ ලක්ෂණ:**

සංකීර්ණ ගැටලු විශ්ලේෂණාත්මකව කොටස්වලට බෙදා ගෙන අධ්‍යයනය කරයි.

e. මැනීම් හා දත්ත විශ්ලේෂණය

**ගුණාත්මක පර්යේෂණ ලක්ෂණ:**

දත්ත රැස්කිරීම හා විශ්ලේෂණ විෂයානුබද්ධ වේ.

පුද්ගලයන් හා පරිසරය තුළින් දත්ත රැස් කරයි.

තොරතුරු, නිරීක්ෂණ දත්ත ලෙස පවතී.

ප්‍රමාණාත්මක පර්යේෂණ ලක්ෂණ :

අරමුණු මත රඳා පවතී.

පර්යේෂකයාගේ විශ්වාස, අගතීන් මත රඳා නොපවතී.

පිළිගත් ක්‍රම මගින් විශ්ලේෂණය කළ හැක.

සංඛ්‍යා විද්‍යාත්මක දත්ත ලෙස පවතී.

(සිල්වා සහ වනසිංහ, 2004: 22)

**ගුණාත්මක හා ප්‍රමාණාත්මක පර්යේෂණ සංසන්දනය**

ප්‍රමාණාත්මක පර්යේෂණවලදී විචල්‍යයන්ගේ හැසිරීම ප්‍රමාණාත්මකව මනිනු ලැබේ. ගුණාත්මක පර්යේෂණවලදී විචල්‍යන් පිළිබඳ ගුණාත්මක ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කෙරේ. ගුණාත්මක දේ මැන දැක්වීම අසීරුය. ඇතැම් ක්‍රම ආදේශ කිරීම් මගින් ඒවා ප්‍රමාණාත්මකව මැන දැක්විය හැකිය. මේ අයුරින් ගුණාත්මක තත්ත්වයන් හා ප්‍රපංචයන් පිළිබඳව කරනු ලබන පර්යේෂණ

ගුණාත්මක පර්යේෂණ ලෙස හැඳින් වේ. ප්‍රත්‍යක්ෂ මූල සමීක්ෂණ හා සංඛ්‍යාන විද්‍යාත්මක පර්යේෂණ ප්‍රමාණාත්මක පර්යේෂණ ලෙස හැඳින් වේ. ලිපි ලේඛන පරිශීලනය, ඉතිහාසය අධ්‍යයනය, දැනුම රැස් කිරීම වැනි ක්‍රම ගුණාත්මක පර්යේෂණ වේ. බොහෝ විට ගුණාත්මක පර්යේෂණවලදී පර්යේෂකයා විසින්ම දත්ත ලබා ගනී. ප්‍රමාණාත්මක පර්යේෂණවලදී වෙනත් නියෝජිතයන් යොදවා සමීක්ෂණ සිදු කෙරෙයි. අතැම් පර්යේෂණවලදී මේ පර්යේෂණ ක්‍රම දෙකම භාවිත කරනු ලැබේ. පර්යේෂණ ක්‍රම දෙක එකවර භාවිත කිරීම සම්බන්ධ සීමා පවතී. ගුණාත්මක පර්යේෂණවලදී එක් දෙයක් පිළිබඳ වඩා ගැඹුරින් අධ්‍යයනය කළ හැකිය. ආකල්ප හා අදහස් පිළිබඳ අධ්‍යයනය, ගැඹුරින් සම්මුඛ සාකච්ඡා සිදු කිරීම කළ හැකිය. මිනිසුන්ගේ, සතුන්ගේ චර්යාවන් පිළිබඳ කරන අධ්‍යයනවලදී ගුණාත්මක පර්යේෂණ ක්‍රම වඩා වැදගත් වේ.

| ප්‍රමාණාත්මක පර්යේෂණ | ගුණාත්මක පර්යේෂණ |
|---|---|
| පර්යේෂකයා විසින් ම සිදු කළ යුතු නැත. | පර්යේෂකයා විසින් ම සිදු කරයි. |
| විචල්‍යයන්ට ඉලක්ක කර ඇත. | ක්‍රියාවලියක් හෝ සිද්ධියක් ඉලක්ක කර ඇත. |
| සිද්ධි රාශියක් හෝ අරමුණු කිහිපය-ක් සම්බන්ධ වේ. | ඉතා සුළු සිද්ධියක් හා විෂයයක් සම්බන්ධ වේ. |
| සංඛ්‍යාත්මක විශ්ලේෂණය | |
| යථාර්ථවාදී බව | තේමා විශ්ලේෂණය |
| ගුණාත්මක බව | |

මේ අනුව පර්යේෂණ ප්‍රවේශ දෙකම ඒවාට ආවේණික ක්‍රමවලින් යුක්ත බව පෙනෙන්නට තිබේ. චීන භාෂාව හා වාග්විද්‍යාව සම්බන්ධව අප තොරාගන්නා සංසිද්ධියට අනුව හෙවත් ගැටලුවට අනුව කුමන ක්‍රමය යෝග්‍යදැයි තීරණය කළ යුතුය. ගුණාත්මක හා ප්‍රමාණාත්මක පර්යේෂණ ප්‍රවේශ දෙකම වාග්විද්‍යා විෂය ක්ෂේත්‍රයෙහි පර්යේෂණ සඳහා යොදා ගැනෙන බව පැහැදිලි කරුණකි. මෙහිදී රිචඩ් හා කුක් යන දෙපල විසින් ප්‍රකාශ කරන ලද "හඳුනා ගැනීමේ පහසුව සඳහා මෙසේ කොටස්වලට වෙන් කළ ද පර්යේෂණ සඳහා

ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක යන ක්‍රම දෙකම යොදා ගැනීම යෝග්‍ය ය.” යන අදහස මතු වී පෙනේ.

## චීන භාෂාව සම්බන්ධ වාග්විද්‍යාත්මක පර්යේෂණ සිදු කිරීමේදී පර්යේෂණ ප්‍රවේශ යොදා ගත හැකි ආකාරය

වාග්විද්‍යාව ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා දක්වනු ලැබේ. එනම් සාර්ව වාග්විද්‍යාව සහ ශුද්‍ර වාග්විද්‍යාව වශයෙනි. භාෂාවක අභ්‍යන්තර සංස්ථිතීන් සහ ව්‍යවහාරික පක්ෂය මේ කොටස් දෙක මගින් අධ්‍යයනය කෙරෙයි. ඒ අනුව චීන භාෂාව සම්බන්ධව අභ්‍යන්තර සහ ව්‍යවහාරික වශයෙන් වාග්විද්‍යාත්මක පර්යේෂණ වර්ග කළ හැකිය. එම පර්යේෂණ සඳහා කුමන පර්යේෂණ ප්‍රවේශයක් අනුග මනය කරන්නේද යන්න පර්යේෂණයෙහි ස්වභාවය අනුව තීරණය කළ යුතු වේ. නිදසුන් කිහිපයක් මගින් එම තත්ත්වය සාකච්ඡා කිරීම වඩා පහසු වේ.

“චීන සහ සිංහල භාෂාවන්හි සරල වාක්‍යයක සංස්ථිතිය” යන පර්යේෂණය චීන සහ සිංහල භාෂා දෙක අතර සිදු කෙරෙන වාග්විද්‍යාත්මක මෙන්ම සංසන්දනාත්මක අධ්‍යයනයකි. එහිදී භාෂා දෙකෙහි අභ්‍යන්තර සංස්ථිතීන් විමර්ශනයට මෙන්ම විග්‍රහයට ලක් කෙරෙයි. මෙම පර්යේෂණයෙහිදී පර්යේෂණයට යොදා ගනුයේ කථන භාෂාව ද, ලේඛන භාෂාව ද, එම ස්වරූප දෙකම ද යන්න පර්යේෂකයා තීරණය කළ යුතු වේ. එහිදී, ලේඛන භාෂාව යොදා ගන්නේ නම්, මෙම පර්යේෂණය සඳහා වඩාත් යෝග්‍ය වන්නේ ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශයයි. ඒ අනුව ලිපි ලේඛන පරිශීලනය, පොත්පත් පරිශීලනය වැනි ක්‍රම අනුගමනය කළ යුතුය. පර්යේෂකයා විසින් ම දත්ත ලබා ගත යුතුය. කථන භාෂාව පර්යේෂණ සීමාව ලෙස යොදා ගන්නේ නම්, තත්ත්වය මීට වඩා වෙනස් වේ. එහිදී පටිගත කිරීම් වැනි ක්‍රම භාවිත කිරීමට සිදු වන අතර, සංඛ්‍යාත්මකව දත්ත විශ්ලේෂණය කරමින් නිශ්චිතව සරල වාක්‍යය හඳුනා ගැනීම කළ යුතුය. නිවැරදි වාක්‍යයක අනුපිළිවෙළ සකසා ගත යුතුය. අනතුරුව වාක්‍ය විග්‍රහයන් සිදු කිරීම සුදුසු වේ. මෙහිදී ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශ අනුගමනය කළ හැකිය.

"චීන භාෂාවේ තුන් වන තානය උච්චාරණයේදී සිංහල සිසුන් අතර පවත්නා ගැටලු" වැනි මාතෘකාවක් යටතේ පර්යේෂණයක් සිදු කිරීමේදී, පර්යේෂකයා ක්ෂේත්‍ර ගවේෂණයක් සිදු කළ යුතු වේ. විචල්‍යයන්ගේ හැසිරීම ප්‍රමාණාත්මකව මැණිය යුතුය. ක්‍රම ආදේශ කිරීම් මගින් දත්ත ප්‍රමාණාත්මකව මැන දැක්විය යුතුය. මෙහිදී භාවිත කෙරෙන්නේ ප්‍රමාණාත්මක පර්යේෂණ ප්‍රවේශයයි. ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශයද මේ සඳහා අඩු වශයෙන් යොදා ගත හැකිය.

චීන භාෂාව ශබ්ද සංදිග්ධතා සහිත භාෂාවක් වන හෙයින් "චීන භාෂාව ඉගැන්වීමේදී ශ්‍රී ලංකාව තුළ ගුරුවරුන් මුහුණ දෙන ගැටලු" වැනි මාතෘකාවක් යටතේ පර්යේෂණයක් සිදු කිරීමේදී, පර්යේෂකයා වැඩි වශයෙන් භාවිත කළ යුත්තේ ප්‍රමාණාත්මක පර්යේෂණ ප්‍රවේශයයි. එයට හේතු වන්නේ, පර්යේෂකයා ක්ෂේත්‍ර ගවේෂණ

යක් සිදු කළ යුතු වීම, විචල්‍යයන්ගේ හැසිරීම ප්‍රමාණාත්මකව මැණිය යුතු වීම, ක්‍රම ආදේශ කිරීම් මගින් දත්ත ප්‍රමාණාත්මකව මැන දැක්විය යුතු වීම යනාදියයි.

"දෙවන භාෂාවක් ලෙස චීන භාෂාව ඉගැන්වීමේදී සංස්කෘතික කුසලතාව මැන බැලීමේ වැදගත්කම" යන පර්යේෂණය, ව්‍යවහාරික වාග්විද්‍යාවෙහි ප්‍රධාන වශයෙන් සාකච්ඡා කෙරෙන "දෙවන හෝ විදේශ භාෂා ඉගෙනුම් හා ඉගැන්වීම්" යන මාතෘකාව හා සම්බන්ධ වේ. මෙමගින් භාෂාවේ ව්‍යවහාරික පක්ෂය පර්යේෂණයට ලක් කෙරෙයි. සංස්කෘතික කුසලතාව සම්බන්ධ ද්විතීයික මූලාශ්‍ර බොහෝ ප්‍රමාණයක් ඇති බැවින්, දත්ත විශ්ලේෂණය සඳහා ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශය වැඩි වශයෙන් යොදා ගැනීම වඩාත් පහසු වේ. මීට අමතරව ප්‍රමාණාත්මක ප්‍රවේශයෙන් දත්ත විශ්ලේෂණය කිරීම ද කළ හැකිය. මෙම ප්‍රවේශ දෙකම වුවද භාවිත කළ හැකිය.

සාකච්ඡා කරන ලද පර්යේෂණ මාතෘකා අනුව පැහැදිලි වන්නේ ඒ ඒ මාතෘකාවට අනුව පර්යේෂණ ප්‍රවේශය නිසි පරිදි තෝරා ගත යුතු බවයි. වඩා යෝග්‍ය පර්යේෂණ ප්‍රවේශය තෝරා ගැනීමෙන් සාර්ථක පර්යේෂණයක් සිදු කිරීමට පර්යේෂකයාට අවස්ථාව සැලසෙන බවයි.

## සමාලෝචනය

ලෝකයේ ඕනෑම ක්ෂේත්‍රයක කාර්යක්ෂමතාව සඳහා පර්යේෂණ ඉතා වැදගත් මෙන්ම ඵලදායී වේ. පර්යේෂණ නම් පුළුල් විෂය ක්ෂේත්‍රය හඳුනා ගැනීමේ පහසුව පිණිස ප්‍රමාණාත්මක හා ගුණාත්මක වශයෙන් වර්ග කර ඇත. ගුණාත්මක හා ප්‍රමාණාත්මක පර්යේෂණ යොදා ගත හැකි ආකාර සහ ඒවායේ විශේෂ ලක්ෂණ වෙන වෙනම හඳුනා ගත හැකිය. ගුණාත්මක හා ප්‍රමාණාත්මක පර්යේෂණ අතර සමානතා සහ අසමානතා වෙන වෙනම වර්ගීකරණයට ලක් කළ හැකිය. මේ අධ්‍යයනයෙහි විමර්ශනය කෙරෙන කරුණු අනුව නිගමනය කළ හැකි වන්නේ, චීන භාෂාව හා වාග්විද්‍යාව සම්බන්ධ පර්යේෂණ ගුණාත්මක හා ප්‍රමාණාත්මක පර්යේෂණ ප්‍රවේශ දෙකින් වෙන වෙනමත්, ගුණාත්මක හා ප්‍රමාණාත්මක පර්යේෂණ මිශ්‍ර ක්‍රමයෙනුත් සිදු කළ හැකි බවයි.

## ආශ්‍රිත මූලාශ්‍රය


1. උයන්ගොඩ, ජයදේව (2016). සමාජීය විද්‍යා පර්යේෂණ යෝජනාවලියක් ලිවීම. කොළඹ: සමාජ විද්‍යාඥයන්ගේ සංගමය.
2. කොඩිතුවක්කු, කොඩ්වින් (2020). පර්යේෂණ ක්‍රියාවලිය හඳුනා ගනිමු. බත්තරමුල්ල: සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණය පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන ආයතනය.
3. ජයසූරිය, චන්ද්‍රා (2000). අධ්‍යාපන පර්යේෂණ ක්‍රම ශිල්ප. කොළඹ: කොළඹ විශ්වවිද්‍යාලය.
4. රාජපක්ෂ, ආර්.එම්.ඩබ් (2009). වාග්විද්‍යා ප්‍රවේශය 2. කැලණිය: වාග්විද්‍යා අධ්‍යයන අංශය,
5. ශ්‍රී ලංකාව. පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව (2013), අධ්‍යාපන පර්යේෂණ කරණයේදී පර්යේෂණ යෝජනාවක් ලිවීමට උපදෙස්, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.
6. ලලිතධීර, කේ.ඒ.(2018). පර්යේෂණ ක්‍රමවේදය සහ ක්‍රම. මහරගම: එල්.එම්.ඩී.ප්‍රකාශකයෝ.
7. සේනාධීර, සිල්වි සහ වනසිංහ, ශාමින්ද (2004). පර්යේෂණ ක්‍රමවේදය. කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.
8. සිරිසුමන, හඳගිරියේ සහ ඥාණාවාස, මිනුවන්ගොඩ: සංස්.) (2019). පර්යේෂණ ක්‍රමවේදය හා පර්යේෂණ ක්‍රියාවලිය. අනුරාධපුර: ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය.